“නුඹලා ඔවුනට ඇහුන්කන් දෙන්න. ඔවුනට අවනත වන්න. සැබැවින්ම ඔවුන් මත පවරනු ලැබූ දෑ ඔවුන් මත (පැවරුණු වගකීම) ය. නුඹලා මත පවරනු ලැබූ දෑ නුඹලා මත (පැවරුණු වගකීම)ය.” යැයි පැවසූහ

වාඉල් ඉබ්නු අල්-හළ්රමී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. වරක් සලමා ඉබ්නු යසීද් අල් ජුඃෆී (රළියල්ලාහු අන්හු) තුමා අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් මෙසේ විමසා සිටියේය. "අහෝ අල්ලාහ්ගේ නබිවරය! නායකයෝ අපට එරෙහිව නැගී සිට ඔවුන්ගේ අයිතිය අපෙන් ඉල්ලා සිටිය ද අපගේ අයිතීන් ඔවුන් වළක්වන්නේ නම් ඒ ගැන ඔබ සිතන්නේ කෙසේ ද? ඔබ අපට අණ කර සිටින්නේ කුමක්ද?" එවිට එතුමාණෝ එය නොසළකා හැරියහ. පසුව නැවතත් එතුමාගෙන් විමසුවේය. එවිට ද එතුමාණෝ එය නොසළකා හැරියහ. පසුව දෙවන වතාවේ හෝ තුන්වන වතාවේ හෝ විමසා සිටිය දී අෂ්අස් ඉබ්නු කයිස් තුමා එතුමාව ඇද්දේය.
තවද එතුමාණෝ “නුඹලා ඔවුනට ඇහුන්කන් දෙන්න. ඔවුනට අවනත වන්න. සැබැවින්ම ඔවුන් මත පවරනු ලැබූ දෑ ඔවුන් මත (පැවරුණු වගකීම) ය. නුඹලා මත පවරනු ලැබූ දෑ නුඹලා මත (පැවරුණු වගකීම)ය.” යැයි පැවසූහ.
[صحيح] [رواه مسلم]

තමන්ට ඇහුන්කන් දීමට හා අවනත වීමට නියෝග කරමින් තම අයිතීන් පමණක් ජනතාවගෙන් ඉල්ලා හිඳ, ඔවුන් කෙරෙහි නියම වූ යුක්තිය පසදලීම, පොදු දේපල නිසි අයුරින් බෙදා දීම, අපරාධ වළක්වාලීම හා සමසේ කටයුතු කිරීම යනාදී මිනිසුන්ගේ වගකීම් පැහැර හරින පාලකයින් පිළිබඳව හා ඔවුන් සමග අප කටුයුතු කළ යුත්තේ කෙසේදැ?යි ඔබ අපට අණ කර සිටින්නේ කුමක්දැයි යන වග නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් විමසන ලදී. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ එය නොසළකා හැරියහ. එම ප්රශ්ණය එතුමාණෝ පිළිකුල් කර සිටියාක් මෙන් විය. නමුත් ප්රශ්න කරන්නා දෙවන තුන්වන වතාවටත් එසේ ප්රශ්න කර සිටියේය. එවිට අසා සිටින්නා නිහඩ කිරීම සඳහා අෂ්අස් ඉබ්නු කයිස් (රළියල්ලාහු) තුමා ඔහුව පැත්තකට ඇද්දේය. එවිට, සල්ලල්ලාහු තුමාණෝ පිළිතුරු දෙන්නට වූහ: “නුඹලා ඔවුනට ඇහුන්කන් දෙන්න. ඔවුන්ගේ කටයුතුවල දී ඔවුනට අවනත වන්න. සැබැවින්ම ඔවුන් මත පැවරෙනුයේ යුක්තිය පසඳලීම හා පාලනය සතු වගකීම් ඉටු කිරීම යනාදී පැවරුණු වගකීම් ය. නුඹලා මත පැවරෙනුයේ අවනත වීම, වගකීම් ඉටු කිරීම පරීක්ෂණ මත ඉවසීමෙන් කටයුතු කිරීම යනා දී පැවරුණු වගකීම්ය.

http://www.sunnah.global/hadeeth/si/show/5037